පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 13 |

අවසාන වාර පරීක්ෂණය - 2024

විෂයය :- ආර්ථික විද්‍යාව I

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................

කාලය : 02

සැලකිය යුතුයි :

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- අංක 01 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ පසුපස දක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා

---

**(1).** ආවස්ථික පිරිවැයක් ඇතිවන අවස්ථාවක් වන්නේ පහත දෑ අතරින් කුමක් ද?

1. නොමිල භාණ්ඩ පරිභෝජනය කරන විට
2. එක් භාවිතයකට පමණක් සීමාවන කිසියම් නිෂ්පාදන සාධකයක් භාවිත කරන විට
3. පොදුවේ රටතුළ සේවා වියුක්තියක් පවතින විට සේවා වියුක්ත සම්පත් සේවා නියුක්ත කිරීමට යොමුවන විට
4. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ඇතුළත ලක්ෂයක සිට එක් භාණ්ඩයකින් නිමැවුම වැඩි කරන විට
5. පාසල් සිසුන්ට නොමිලේ නිල ඇඳුම් ලබදෙන විට

**(2).** නව ව්‍යාපාරයක් ස්ථාපිත කිරීම සඳහා පහත කුමන සාධකයක් සියල්ලට ප්‍රථමයෙන් අවශ්‍ය වේ ද?

1. භූමිය
2. ශ්‍රමය
3. ප්‍රාග්ධනය
4. ව්‍යවසායකත්වය
5. භූමිය හා ශ්‍රමය

**(3).** අනෙකුත් සාධක නොවෙනස්ව පවතින විට ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය වමට විතැන්වීම සඳහා ආර්ථිකයේ ශ්‍රම වෙළඳපොළ තුළ පහත දැක්වෙන කුමන වෙනසක් සිදු විය යුතු ද?

1. ශ්‍රමිකයන්ගේ ආගමන ඉහළ යාම
2. විශ්‍රාම යන වයස් සීමාව ඉහළ යාම
3. ශ්‍රම ඵලදායිතාවය ඉහළ යාම
4. පාසල් හැරයාමේ කාලය ඉහළ යාම
5. ශ්‍රමිකයන්ගේ නිපුණතා ඉහළ යාම

**(4).** වෙළෙඳපොළ ආර්ථික පද්ධතියක

1. මිල යාන්ත්‍රණය ක්‍රියාත්මක වේ
2. සාධාරණත්වය ඇතිවේ
3. මධ්‍ය සැලසුම් අධිකාරියක් මගින් භාණ්ඩ මිල තීරණය කරනු ලබයි
4. සියලු දේපොළ රජය සතු වේ
5. රජයට අයත් කාර්යභාරය විශාල වේ

**(5).** පහත දැක්වෙන වෙනස්වීම් අතරින් ඉල්ලුම් වක්‍රයක් විතැන් නොවීමට බලපාන සාධකයක් වන්නේ කුමක් ද?


1. ආදේශ භාණ්ඩයේ මිල වැඩිවීම
2. ආදේශ භාණ්ඩයේ මිල අඩු වීම
3. සලකා බලන භාණ්ඩයේ මිල අඩු වීම
4. පාරිභෝගික ආදායම අඩු වීම
5. අනුපූරක භාණ්ඩයේ මිල අඩු වීම

**(6).** පහත දැක්වෙන සැපයුම් සමීකරණ අතරින් සැපයුම් නීතිය ප්‍රකාශ නොවන සැපයුම් සමීකරණය කුමක් ද?

1. $Qs = -200 + 2P$
2. $Qs = 200 + 5P$
3. $Qs = 8P$
4. $Qs = 200$
5. $Qs = P$

**(7).** භාණ්ඩයක වෙළඳපළ ඉල්ලුම වක්‍රය පහතින් දැක්වේ. A ලක්ෂ්‍යයේ මිල ඉල්ලුම් නම්‍යතාවය කොපමණ වේ ද?

1. - 4
2. - 2
3. - 0.25
4. - 0.33
5. - 0.6




**(8).** බස් ප්‍රවාහනය හා දුම්රිය ප්‍රවාහනය සඳහා වන හරස් ඉල්ලුම් නම්‍යතාවය 2 කි. බස් ගාස්තු ඉහළ යාම නිසා දුම්රිය ප්‍රවාහනය සඳහා 10% ක ඉල්ලුම් ප්‍රමාණයේ වැඩිවීමක් සිදුවිය. මෙයට හේතු විය හැකි බස් ගාස්තු වැඩිවීම රුපියල්වලින් දැක්වූ විට පහත කුමක් නිවැරදි වේ ද?

| | (රුපියල්) සිට | (රුපියල්) දක්වා |
|---|---|---|
| 1. | 200 | 210 |
| 2. | 300 | 330 |
| 3. | 400 | 450 |
| 4. | 500 | 600 |
| 5. | 600 | 700 |

**(9).** ඔපෙක් සංවිධානය බණිජ තෙල් සැපයුම වැඩි කිරීමට ගත් තීරණය නිසාත් , ආර්ථික වෘද්ධිය උදෙසා කටයුතු කරන රටවල ඇති වූ බණිජ තෙල් ඉල්ලුම වැඩිවීම නිසාත්, ලෝක බණිජ තෙල් සමතුලිත මිල කෙරෙහි එය බලපානු ලබන්නේ කෙසේ ද?

1. බණිජ තෙල් මිල වැඩිවේ
2. බණිජ තෙල් මිල අඩු වේ
3. බණිජ තෙල් මිල අඩු වුවද හුවමාරු ප්‍රමාණය වැඩිවේ
4. බණිජ තෙල් මිල නොවෙනස්ව පවතී
5. බණිජ තෙල් මිල වෙනස්වීම අවිනිශ්චිත වේ

**(10).** පාරිභෝගික ආදායම රුපියල් 60 000 සිට 80 000 දක්වා වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ වර්ග කිහිපයක ඉල්ලුම් ප්‍රමාණයේ ඇති වූ වෙනස පහතින් දැක්වා ඇත.

| භාණ්ඩය | ආදායම 60 000 දී ඉල්ලුම් ප්‍රමාණය | ආදායම 80 000 දී ඉල්ලුම් ප්‍රමාණය |
|---|---|---|
| A | 1 000 | 960 |
| B | 1 000 | 1 000 |
| C | 2 000 | 2 400 |
| D | 3 000 | 2 700 |
| E | 3 000 | 3 500 |


ආදායම් ඉල්ලුම් නම්‍යතාවයට අනුව ඉහත භාණ්ඩ අතරින් කුමක් බාල භාණ්ඩ වේ ද?

1. D
2. A හා B
3. B හා E
4. E හා D
5. A හා D

(11). ආයතනයක් නිපදවනු ලබන භාණ්ඩයක මිල 5% කින් වැඩි වූ විට එම ආයතනයේ සමස්ථ අයභාරය ද 5% කින් වැඩි විය. මෙම භාණ්ඩයේ මිල ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ කුමක් ප්‍රකාශ වේ ද?

1. නම්‍ය වේ
2. අනම්‍ය වේ
3. ඒකීය වේ
4. පූර්ණ අනම්‍ය වේ
5. පූර්ණ නම්‍ය වේ

(12). රජයක් විසින් නිෂ්පාදකයන් මත විශේෂිත බද්දක් අය කළ විට, පැවති සැපයුම් වක්‍රය $S_1$ , බද්ද පසු $S_2$ ලෙස වෙනස් වී ඇති ආකාරය රූපසටහනේ නිරූපනය වේ.




බද්දෙන් පසු නිෂ්පාදකයන් විසින් දැරිය යුතු බදු බර හා නිෂ්පාදන අතිරික්තයේ අඩුවීම නිරූපනය වන්නේ,

| | නිෂ්පාදන බදු බර | නිෂ්පාදන අතිරික්තය අඩුවීම |
|---|---|---|
| 1. | RQUW | UTX |
| 2. | PQUT | PQXT |
| 3. | PQUT | PQUT |
| 4. | PRWT | WTX |
| 5. | QRWU | UTX |

(13). රජයක් කිසියම් කෘෂි භාණ්ඩයක් සඳහා රුපියල් 120 ක සහතික මිලක් නියම කරමින් ඌණ පූර්ණ ගෙවීම් ක්‍රමයක් අනුගමනය කරයි. ඌණ පූර්ණය සඳහා රජයේ මුළු වියදම රුපියල් ලක්ෂ 140 ක් වූ අතර මෙම ප්‍රතිපත්තිය නිසා නිෂ්පාදන අතිරික්තය රුපියල් ලක්ෂ 60 කින් ද පාරිභෝගික අතිරික්තය රුපියල් ලක්ෂ 70 කින් ද වැඩි විය. රාජ්‍ය මැදිහත්වීම නිසා ඇති වූ සමස්ත සුභසාධන පාඩුව කොපමණ ද?

1. රුපියල් ලක්ෂ 120
2. රුපියල් ලක්ෂ 140
3. රුපියල් ලක්ෂ 130
4. රුපියල් ලක්ෂ 10
5. රුපියල් ලක්ෂ 20

(14). කිසියම් භාණ්ඩයක මිල ඉල්ලුම් නම්‍යතාවය අපරිමිත වන බවත් සැපයුම් මිල නම්‍යතාවය ශුන්‍යවන බවත් සිතන්න. මෙම භාණ්ඩය මත රජය නිෂ්පාදන සහනාධාරයක් ලබා දෙන විට,

1. සහනාධාරයේ වාසිය පාරිභෝගිකයන් හා නිෂ්පාදකයන් අතරේ සමානව බෙදී යයි
2. සහනාධාරයේ වැඩි වාසියක් නිෂ්පාදකයන්ට හිමි වේ
3. සහනාධාරයේ වැඩි වාසියක් පාරිභෝගිකයාට හිමි වේ
4. සහනාධාරයේ සම්පූර්ණ වාසිය නිෂ්පාදකයන්ට හිමි වේ
5. සහනාධාරයේ සම්පූර්ණ වාසිය පාරිභෝගිකයාට හිමි වේ

(15). කෙටිකාලයේ දී ව්‍යාපාර ආයතනයක සාමාන්‍ය ඵලදායිතාවය උපරිම වන විට,

1. ව්‍යාපාරයේ හීන වන ඵල ඇති වේ
2. ව්‍යාපාරයේ හීනවන පරිමාණුකුල ඵල ඇති වේ
3. සාමාන්‍ය ස්ථාවර පිරිවැය අවම වේ
4. සාමාන්‍ය විචල්‍ය පිරිවැය අවම වේ
5. මුළු ඵලදායිතාවය උපරිම වේ

(16). කිසියම් නිෂ්පාදන ආයතනයක දිගු කාලයේදී නිමැයුම හා සාමාන්‍ය පිරිවැය අන්තර්ගත ලේඛනයක් පහතින් දැක්වේ.

| නිමැවුම | දිගු කාලීන සාමාන්‍ය පිරිවැය |
|---|---|
| 100 | 80 |
| 200 | 70 |
| 300 | 50 |
| 400 | 45 |
| 500 | 45 |

ඉහත ලේඛනයට අනුව,

1. නිමැවුම 400 සිට වැඩිවන විට සාමාන්‍ය ස්ථාවර පිරිවැය නොවෙනස්ව පවතී
2. නිමැවුම 400 සිට වැඩිවන විට මුළු ස්ථාවර පිරිවැය නොවෙනස්ව පවතී
3. නිමැවුම 100 සිට 400 දක්වා වැඩිවන විට පරිමාණුකූල පිරිමැසුම් ඇතිවේ
4. නිමැවුම 200 සිට වැඩි කිරීමේදී පරිමාණුකූල නොපිරිමැසුම් ඇති වේ
5. සාමාන්‍ය ස්ථාවර පිරිවැය ක්‍රමයෙන් අඩු වේ

(17). ව්‍යාපාර ආයතනයක් සම්බන්ධයෙන් පහත සඳහන් කුමන ප්‍රකාශයක් නිවැරදි වේ ද?

1. ලාභ උපරිමයට අවශ්‍ය කොන්දේසිය වන්නේ ආන්තික අයභාරය ආන්තික පිරිවැයට වඩා වැඩි වීමයි
2. පූර්ණ තරගකාරී ආයතනයක ලාභ උපරිමයට අදාළ කොන්දේසිය, මිල ආන්තික අයභාරයට සමාන වීම ලෙස ද ප්‍රකාශ කළ හැකිය
3. භාණ්ඩයේ මිල ඉක්මවා සාමාන්‍ය පිරිවැය පවතින සෑමවිටම ව්‍යාපාරට ආර්ථික ලාභ ඇති වේ
4. පූර්ණ තරගකාරී ආයතන මෙන්ම ඒකාධිකාරී ආයතන සමජාතීය භාණ්ඩ නිපදවයි.
5. අලාභ ලැබුවද සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා මිල වැඩිවන විට ව්‍යාපාර පවත්වාගෙන යායුතු වේ

(18). වී ගොවියෙකු එක් කන්නයක් අවසානයේදී ගොවිතැනෙන් රුපියල් 250 000 ක අවම ඉපයීමක්වත් අපේක්ෂා කරනු ලබයි. එම කන්නය අවසානයේදී ඔහු රුපියල් 350 000 ඉපයීමක් ලබාගනී නම් ගොවියාගේ සංක්‍රාම ඉපයීම හා ආර්ථික බදු කුලිය කොපමණ ද?

| | සංක්‍රාම ඉපයීම (රුපියල්) | ආර්ථික බදු කුලිය (රුපියල්) |
|---|---|---|
| 1. | 250 000 | 100 000 |
| 2. | 350 000 | 250 000 |
| 3. | 100 000 | 250 000 |
| 4. | 150 000 | 50 000 |
| 5. | 250 000 | 350 000 |

(19). පහත සඳහන් කුමක් දළ ප්‍රාග්ධන සම්පාදනය සඳහා කරනු ලබන වියදමක් වන්නේ ද?

1. පුද්ගලයෙකු ඉඩමක් මිලදී ගැනීම
2. පුද්ගලයෙකු නව නිවසක් මිලදී ගැනීම
3. කුටුම්භයක් මෝටර් රථයක් මිලදී ගැනීම
4. කර්මාන්තශාලාවක සේවක වැටුප් වැඩි කිරීම
5. පුද්ගලයෙකු නිවසට අවශ්‍ය ගෘහ භාණ්ඩ මිලට ගැනීම

(20). ඕනෑම ආර්ථිකයක දළ දේශීය නිෂ්පාදිතය නිවැරදිව ප්‍රකාශ වන්නේ,

1. දළ මෙහෙයුම් අතිරික්තය + දළ මිශ්‍ර ආදායම + සේවක ගෙවීම්
2. පෞද්ගලික පරිභෝජනය + රාජ්‍ය පරිභෝජනය + දළ ආයෝජනය
3. දළ ජාතික ආදායම + විදේශ ශුද්ධ ද්විතීක ආදායම
4. දළ ජාතික ආදායම - ශුද්ධ අපනයනය
5. දළ දේශීය ඉතුරුම් + පෞද්ගලික හා රාජ්‍ය පාරිභෝජන වියදම්

(21). පහත දැක්වෙන කවුරුන් ශ්‍රී ලංකාවේ අනේවාසිකයකු වන්නේ ද?

1. වසර පහක් නොරොච්චෝලේ සේවා නියුක්ත චීන ශ්‍රමිකයෙකු
2. වසර තුනක් පූර්ණ කාලීනව චීනයේ අධ්‍යාපනය හදාරන ශ්‍රී ලාංකික ශිෂ්‍යයෙකු
3. මාස නවයක් ඉන්දියාවේ රැකියාවක් කර පැමිණෙන ශ්‍රී ලාංකිකයෙකු
4. වසර තුනක් කටාර් රාජ්‍යයේ සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයෙකු
5. ශ්‍රී ලංකා ගුවන් යානයක සේවය කරන ශ්‍රී ලාංකිකයෙකු

(22). පහතින් දැක්වෙන්නේ කිසියම් ආර්ථිකයක ජාතික ගිණුම්කරණයට අදාළ කල්පිත සංඛ්‍යා දත්ත කිහිපයකි. (සංඛ්‍යා රුපියල් බිලියන)

| | |
|---|---|
| දළ මිශ්‍ර ආදායම | 4 000 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 6 000 |
| සේවක ගෙවීම් | 5 000 |
| නිෂ්පාදන හා ආනයන මත ශුද්ධ බදු | 5 700 |
| දළ දේශීය වියදම | 21 000 |

ආර්ථිකයේ ශුද්ධ අපනයන රුපියල් බිලියනවලින් කොපමණ ද?

1. 20 700
2. 700
3. 300
4. – 300
5. – 700

(23). ආර්ථිකයක අනවශ්‍ය තොග සමුච්ඡනය රුපියල් බිලියන 50 ක් බව සලකන්න, මින් ඇගවෙන්නේ ආර්ථිකයේ,

1. ජාතික ආදායම උච්ඡාවචනවලින් තොරව පවතින බවයි
2. සමාහාර ආදායම සමාහාර වියදමට සමාන බවයි
3. කාන්දුවීම් විදීම්වලට සමාන බවයි
4. සාර්ව ආර්ථික සංකෝචනයක් සිදුවන බවයි
5. සාර්ව ආර්ථික ප්‍රසාරණයක් සිදුවන බවයි

(24). කුටුම්භ වැයකලහැකි ආදායමෙන් 80% ක් පෞද්ගලික පරිභෝජනය සඳහා යොමු කරන රජය නොමැති සංවෘත ආර්ථිකයක ස්වාධීන පරිභෝජනය රුපියල් බිලියන 200කි. දළ ආයෝජනය රුපියල් බිලියන 20ක් වන එම ආර්ථිකයේ සමාහාර වියදම කොපමණ ද?

1. රුපියල් බිලියන 550
2. රුපියල් බිලියන 220
3. රුපියල් බිලියන 1100
4. රුපියල් බිලියන 1500
5. රුපියල් බිලියන 1150

(25). කිසියම් ආර්ථිකයක ආන්තික පරිභෝජන නැඹියාව 0.8 කි. එම ආර්ථිකයේ ආයෝජනය රුපියල් බිලියන 100 කින් වැඩි වූ අතර රාජ්‍ය බදු රුපියල් බිලියන 125 කින් වැඩි කර තිබුණි. ආර්ථිකයේ,

1. නිමැවුම රුපියල් බිලියන 500 කින් වැඩි වේ
2. නිමැවුම රුපියල් බිලියන 100 කින් අඩු වේ
3. නිමැවුම රුපියල් බිලියන 100 කින් වැඩි වේ
4. නිමැවුම රුපියල් බිලියන 900 කින් වැඩි වේ
5. නිමැවුමේ වෙනසක් සිදු නොවේ

(26). ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10% ක් යටතේ ක්‍රියාත්මකවන වාණිජ බැංකු පද්ධතියට පුද්ගලයෙකු විසින් ජංගම ගිණුමක කරනු ලබන රුපියල් ලක්ෂ 5 ක නව මුදල් තැම්පතුවක් නිසා ආර්ථිකයේ මුදල් සැපයුම උපරිම වශයෙන් වෙනස් විය හැක්කේ,

1. රුපියල් ලක්ෂ 5කින් වැඩි වේ
2. රුපියල් ලක්ෂ 50 කින් වැඩි වේ
3. රුපියල් ලක්ෂ 45 කින් වැඩි වේ
4. රුපියල් ලක්ෂ 50 කින් අඩු වේ
5. මුදල් සැපයුමේ වෙනසක් ඇති නොවේ

(27). කිසියම් පුද්ගලයෙකු වාණිජ බැංකුවක තැම්පත් කර ඇති ඉතුරුම් ගිණුමෙන් ලක්ෂ 10 ක් ඉවත් කර තම ජංගම ගිණුමේ තැම්පත් කරනු ලබයි. මෙහිදි

1. $M_1$ මුදල් සැපයුම වැඩි වේ. $M_2$ මුදල් සැපයුම අඩුවේ
2. $M_1$ මුදල් සැපයුම අඩු වේ. $M_2$ මුදල් සැපයුම වැඩි වේ
3. $M_1$ හා $M_2$ මුදල් සැපයුමේ වෙනසක් ඇති නොවේ
4. $M_1$ මුදල් සැපයුම වැඩිවන නමුත් $M_2$ මුදල් සැපයුම වෙනසක් නොවේ
5. $M_1$ මුදල් සැපයුමට බලපෑමක් ඇති නොවේ

(28). කිසියම් කල්පිත ආර්ථිකයක මුදල් සැපයුම 9%කින් වර්ධනය වූ අතර එම කාලපරිච්ඡේදය තුළ මුදලේ සංසරණ ප්‍රවේගය ස්ථාවරව පැවතුනි. ආර්ථිකයේ මිල මට්ටම 4.5% කින් වර්ධනය වූයේ නම් ආර්ථිකයේ නිමැවුමේ මූර්ත අගය,

1. 2 % කින් වර්ධනය වී ඇත
2. 2 % කින් අඩු වී ඇත
3. 9 % කින් වර්ධනය වී ඇත
4. 9 % කින් අඩු වී ඇත
5. 4.5 % කින් වර්ධනය වී ඇත

(29). මාධ්‍ය බැංකුවක් ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරන විට රජය ද ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් එකවිට අනුගමනය කරයි නම් ආර්ථිකයේ පොළී අනුපාතයට කුමක් සිදුවේ ද?

1. වැඩි වේ
2. අඩු වේ
3. නොවෙනස්ව පවතී
4. වෙනස් වීම අවිනිශ්චිත වේ
5. කෙටි කාලීනව අඩු වේ. දිගු කාලීනව වැඩි වේ

(30). පහත දැක්වෙන කුමක් ආර්ථිකයේ මුදල් සැපයුම අඩු වීමට හේතු වේ ද?

1. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු වීම
2. මහ බැංකුව විවෘත වෙළඳපොළ සුරකුම්පත් අලෙවි කිරීම
3. ප්‍රතිපත්ති පොළී අනුපාතය අඩු කිරීම
4. බැංකු පද්ධතිය රජයට සපයන ණය ඉහළ යාම
5. මහ බැංකුව විවෘත වෙළඳපොළ සුරකුම්පත් මිලට ගැනීම

(31). පාරිභෝජනයේ ඇතිවන ධන බාහිරතාවයක දී,

1. සමාජ ප්‍රතිලාභවලට වඩා සමාජ පිරිවැය වැඩි වේ
2. සමාජ පිරිවැයට වඩා සමාජ ප්‍රතිලාභ වැඩි වේ
3. අධි නිෂ්පාදනයක් ඇති වේ
4. සමාජ ප්‍රශස්ථ නිමැවුම් මට්ටමක් ඇතිවේ
5. සමාජ ප්‍රතිලාභ සමාජ පිරිවැයට සමාන වේ

(32). ශ්‍රී ලංකා අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වියදමක් ලෙස සැලකිය හැක්කේ පහත කුමන විදමක් ද?

1. රජය විසින් රාජ්‍ය සේවකයන්ට කරනු ලබන වැටුප් ගෙවීම්
2. රජයේ පරිපාලන වියදම්
3. රාජ්‍ය ණය සඳහා කරනු ලබන පොලී ගෙවීම්
4. රජයේ සමෘද්ධි සහනාධාර දීමනා
5. රජය මූර්ත වත්කම් අත්පත් කර ගැනීම

(33). පොදු භාණ්ඩ , සුබසාධන භාණ්ඩ , පොදු සම්පත් සඳහා නිදර්ශන සැපයීමේදී අනුපිළිවෙලින් එයට පහත කුමන පිළිතුරක් අදාළ වේ ද?

| | පොදු භාණ්ඩ | සුබසාධන භාණ්ඩ | පොදු සම්පත් |
|---|---|---|---|
| 1. | මහා මාර්ග | නිවාස | උද්‍යාන |
| 2. | ප්‍රදීපාගාර | අධ්‍යාපනය | සාගර සම්පත් |
| 3. | වායු ගෝලය | මත්ද්‍රව්‍ය | වනාන්තර |
| 4. | වරාය | කෞතුකාගාරය | පොදු ළිං |
| 5. | වැසිකිළි පද්ධති | කලාගාර | බස්රථ |


(34). රජයේ දේශීය මූල්‍යනයේ ණය මුලාශ්‍ර සඳහා යොදාගනු ලබන ප්‍රධාන ණය උපකරණය වන්නේ ,

1. භාණ්ඩාගාර බිල්පත්
2. භාණ්ඩාගාර බැඳුම්කර
3. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර
4. මහ බැංකු අත්තිකාරම්
5. රුපියල් ණය

(35). කිසියම් ආර්ථිකයක රාජ්‍ය අයවැය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සමස්ථ අයවැය ශේෂය - 10.2% වූ අතර ප්‍රාථමික ශේෂය - 3.7% ක් විය මේ අතර වෙනසක් ඇති වී තිබෙන්නේ පහත කුමකින් ද?

1. රාජ්‍ය ණය ගෙවීම් අත්හිටුවීමයි
2. රාජ්‍ය ණය වාරිකයයි
3. රාජ්‍ය ණය පොළියයි
4. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය පහසුකමයි
5. රාජ්‍ය බදු ආදායම පහළ යාමයි

(36). කිසියම් රටවල් දෙකක නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර දෙක පහතින් දැක්වේ. එම රටවල් සහල් සහ තේ නිපදවනු ලබයි.




රටවල් භාණ්ඩ සාපේක්ෂ වාසිය යටතේ විශේෂීකරණය කරනු ලබයි නම් විදේශ වෙළෙඳාමෙන් පසු නිමවුමේ කුමන උපරිම නිමවුම් සංයෝගයක් රටවල් වලට ලබාගත හැකි වේ ද?

| | සහල් | තේ |
|---|---|---|
| 1. | 600 | 200 |
| 2. | 600 | 500 |
| 3. | 1200 | 200 |
| 4. | 1200 | 100 |
| 5. | 500 | 200 |

(37). කිසියම් කල්පිත ආර්ථිකයක ගෙවුම් ශේෂයේ වෙළඳ ශේෂය පිළිබඳ දත්ත කිහිපයක් පහත දැක්වේ.

| වර්ෂය | විනිමය අනුපාතය (ඩොලර් / රුපියල්) | අපනයන ඩොලර් මිලියන | ආනයන ඩොලර් මිලියන |
|---|---|---|---|
| 2016 | 109 | 635 | 585 |
| 2017 | 111 | 689 | 645 |

මෙම දත්ත අන්තර්ගතය මගින් කුමක් නිගමනය කළ හැකි වේ ද?

1. මෙම රටේ අපනයන ඉල්ලුම් මිල නම්‍යතාව අනම්‍ය වේ
2. මෙම රටේ ජංගම ගිණුම අතිරික්තයක් නිරූපණය කරයි
3. ආනයනික භාණ්ඩවලින් බොහොමයක් අත්‍යාවශ්‍ය භාණ්ඩ වේ.
4. මාර්ෂල් - ලර්නර් කොන්දේසිය එකට වැඩි වේ
5. මාර්ෂල් - ලර්නර් කොන්දේසිය එකට අඩු වේ

(38). අන්තර් ජාතික වෙළඳාම ප්‍රවර්ධනය උදෙසා පහත දැක්වෙන කුමක් සෘජුවම හේතු වේ ද?

1. ආනයන සලාකනය පහළ හෙළීම
2. පොලී අනුපාතය ඉහළ දැමීම
3. අපනයන කර්මාන්ත සඳහා සහනාධාර සැපයීම
4. ආර්ථික පසුබැසීමකදී වැටුප් අනුපාතය ඉහළ දැමීම
5. ආනයන සීමා කිරීම

(39). ආර්ථිකයක වෙළඳ අනුපාතය 120 වූ අතර ආනයන මිල දර්ශකය 80% කින් වැඩි වී තිබුණි නම් අපනයන මිල දර්ශකය කොපමණද?

1. 216
2. 150
3. 160
4. 90
5. 80

**(40).** ගෙවුම් ශේෂයේ ජංගම ගිණුමට අන්තර්ගත වන ශ්‍රී ලංකාවේ වැඩිම විදේශ විනිමය ලැබීම වන්නේ,

1. සංචාරක ඉපයීම්
2. තේ අපනයන ආදායම
3. ඇඟලුම් අපනයන ආදායම
4. විදේශ සේවා නියුක්ති ප්‍රේෂණ ලැබීම්
5. ප්‍රවාහන සේවා ලැබීම

**(41).** ශ්‍රී ලංකාව හා ඇමරිකා එක්සත් ජනපදය අතර විනිමය අනුපාතය රුපියල් 1 ක් ඩොලර් 0.003 ක් ලෙස පැවති බව සලකන්න. එය රුපියල් 1 ක් ඩොලර් 0.0025 ක් ලෙස වෙනස් වන්නේනම් ඒ බලපෑ හැකි හේතුව වන්නේ,

1. සංචාරක ඉපයීම් ඉහළ යාම
2. තේ අපනයන ආදායම් ඉහළ යාම
3. විදේශ සේවා නියුක්ති ප්‍රේෂණ ඉහළයාම
4. ආනයන වියදම් ඉහළ යාම
5. ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ තුළ විදේශ ආයෝජනය ඉහළ යාම

**(42).** රජයකට ගෙවුම් ශේෂයේ ද්විතික ආදායම් ගිණුමේ හිඟ ශේෂය අඩු කිරීම අවශ්‍ය වේ නම් පහත කුමන ප්‍රතිපත්තියක් ඵලදායි වේ ද?

1. ආනයන ආදේශන ඉහළ නැන්වීම
2. ආනයන මත බදු ඉහළ දැමීම
3. විදේශ සංක්‍රමණික ශ්‍රමිකයන් අඩු කිරීම
4. විදේශ රටවලට ලබාදෙන මූල්‍ය පරිත්‍යාග අඩු කිරීම
5. විදේශ රටවලට ලබාදෙන ප්‍රාග්ධන සංක්‍රාම අඩු කිරීම

**(43).** පළමු වර්ෂයේදී ආර්ථිකයක මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 500කි. දෙවන වර්ෂයේ නාමික දළ දේශීය නිෂ්පාදිතය රුපියල් බිලියන 577.5 දක්වා වැඩි වී ඇති අතර මිල මට්ටමේ වැඩිවීම 5% කි. දෙවන වර්ෂය වන විට මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වැඩිවීම කොපමණ ද?

1. ඩොලර් බිලියන 4.76
2. ඩොලර් බිලියන 40
3. ඩොලර් බිලියන 50
4. ඩොලර් බිලියන 550
5. ඩොලර් බිලියන 520

**(44).** රජයක් ආදායම් විෂමතාව අඩු කිරීම ඉලක්ක ප්‍රතිපත්තියක් අනුගමනය කරයි. ඒ සඳහා ප්‍රතිපත්ති තුනක් සලකා බලනු ලබයි. එම ප්‍රතිපත්ති වඩා සඵලදායි වන්නේ පහත කුමකින් ද?

| | 1.ආන්තික බදු අනුපාතය වැඩි කිරීමේ ප්‍රතිපත්තිය | 2.අවම වැටුප් ඉහළ දැමීමේ ප්‍රතිපත්තිය | 3.සංක්‍රම වියදම ඉහළ දැමීමේ ප්‍රතිපත්තිය |
|---|---|---|---|
| 1. | නිවැරදියි | නැත | නැත |
| 2. | නිවැරදියි | නිවැරදියි | නැත |
| 3. | නිවැරදියි | නැත | නිවැරදියි |
| 4. | නැත | නැත | නිවැරදියි |
| 5. | නැත | නිවැරදියි | නිවැරදියි |

**(45).** කිසියම් කල්පිත ආර්ථිකයක සේවා නියුක්ති අනුපාතය 80% ක් වූ අතර වැඩ කරන වයසේ ජන ගහනය මිලියන 20 ක් විය. ආර්ථිකයේ සේවා වියුක්ත ජන ගහනය මිලියන 2 ක් නම් ශ්‍රම සහභාගිත්ව අනුපාතය කොපමණ ද?

1. 50 %
2. 80 %
3. 75 %
4. 90 %
5. 60 %

(46). රටවල් කිහිපයක දත්ත කිහිපයක් පහතින් දැක්වේ. මෙම සංඛ්‍යා දත්ත ඇසුරින් රටක දුප්පත්කම අඩුම හා ආදායම් විෂමතාවය ද අඩුම රට කුමක් ද?

| | රට | ජාතික දරිද්‍රතා අනුපාතය | ජිනි සංගුණකය |
|---|---|---|---|
| 1. | A | 14.2% | 0 |
| 2. | B | 2.2 % | 0 |
| 3. | C | 1.2 % | 0.65 |
| 4. | D | 5.7% | 0.82 |
| 5. | E | 2.1% | 1 |

(47). ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ ,

1. මානව සංවර්ධන දර්ශකයට අනුව පහළ මානව සංවර්ධනයක් ඇති රටකි
2. මානව සංවර්ධන දර්ශකයට අනුව මධ්‍ය මානව සංවර්ධනයක් ඇති රටකි
3. මානව සංවර්ධන දර්ශකයට අනුව ඉතා ඉහළ මානව සංවර්ධනයක් ඇති රටකි
4. ලෝක බැංකු ආර්ථික වර්ගීකරණයට අනුව පහළ මැද ආදායම් රටකි
5. ලෝක බැංකු ආර්ථික වර්ගීකරණයට අනුව පහළ ආදායම් රටකි

(48). ආර්ථික වෘද්ධිය සඳහා පිටුවහලක් විය නොහැකි කරුණක් වන්නේ කුමක් ද?

1. ආයෝජනය සඳහා ණය සැපයීම
2. ආයෝජනය සඳහා පොලී අනුපාත අඩු කිරීම
3. ප්‍රාග්ධන සම්පත් ඉහළ දැමීම
4. පර්යේෂණ හා සංවර්ධන වියදම් ඉහළ දැමීම
5. ආනයනික යෙදවුම් මිල ඉහළ දැමීම

(49). මානව සංවර්ධන දර්ශකයට අනුව ඉහළ මානව සංවර්ධනයක් ඇති රටක් ලෙස හඳුනාගත හැක්කේ පහත කුමන රටක් හෝ රටවල් ද?

| | |
|---|---|
| A | 0.810 |
| B | 0.921 |
| C | 0.790 |

1. A
2. B
3. C
4. A හා C
5. A, B හා C

(50). ආර්ථික පසුබැසීමකදී වැඩිවිය හැකි නමුත් ආර්ථික ප්‍රසාරණයකදී අඩුවිය හැකි සේවා වියුක්ති තත්ත්වය වන්නේ,

1. ව්‍යුහමය සේවා වියුක්තිය
2. සේවා වියුක්තිය
3. සැඟවුණු සේවා වියුක්තිය
4. චක්‍රිය සේවා වියුක්තිය
5. ස්වාභාවික සේවා වියුක්තිය

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2024

| ශ්‍රේණිය |
| --- |
| 13 |

විෂයය :- ආර්ථික විද්‍යාව II

පාසලේ නම : ..................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : 03

සැලකිය යුතුයි :

- "අ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

"අ" උප කොටස
(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

**(1).**

i. කුඹුරක් භූමිය ලෙස හා සිංහරාජ වනාන්තරය ප්‍රාග්ධනය ලෙස හඳුනාගත හැකිවේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. කල්පිත ආර්ථිකයක වැඩිවන ආවස්ථික පිරිවැයක් පවතින විට එම රටේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ හැඩය කුමක් විය හැකි ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. සාමාජීය වෙළඳපොළ ආර්ථිකයක රජයේ කාර්යයන් මොනවා ද? (ලකුණු 4)

iv. පහත දැක්වෙන සිදුවීම් රටක නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර ඇසුරින් පැහැදිලි කරන්න.

(අ) කෘෂි භාණ්ඩ හා කාර්මික භාණ්ඩ නිපදවන ආර්ථිකයක කෘෂි භාණ්ඩ නිමැවුම වැඩි වූවද කාර්මික භාණ්ඩ නිමැවුම අඩු නොවීම

(ආ) කෘෂිකරමාන්තයේ ඵලදායිතාවය අඩු වීමට තාක්ෂණික පිරිහීම බලපෑම් කිරීම

(ඉ) විදේශ ආයෝජන වැඩිවීම

(ඊ) මූර්ත දළ දේශීය නිෂ්පාදිතය අඩුවීම (ලකුණු 08)

**(2).**

i. සාමාන්‍ය භාණ්ඩයක සමතුලිත මිල වැඩිවීම සඳහා ඉල්ලුමට බලපාන ඕනෑම සාධක තුනක සිදුවිය යුතු වෙනස්කම් මොනවාද යන්න සඳහන් කරන්න. (ලකුණු 3)

ii. මිල ඉල්ලුම් නම්‍යතාවය හා හරස් ඉල්ලුම් නම්‍යතාවය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. නම්‍ය හා අනම්‍ය වශයෙන් වූ සැපයුම වක්‍ර වල නම්‍යතා සංගුණක තැනින් තැනට වෙනස් වේ ද? (ලකුණු 4)

iv. භාණ්ඩයක මිල 2% කින් ඉහළ යන විට භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය 4% කින් අඩු වේ නම් හා භාණ්ඩයට අදාළ පාරිභෝගික ආදායම 2% කින් ඉහළ විට ඉල්ලුම් ප්‍රමාණය 4% කින් අඩු වේ නම්,

(අ) මිල ඉල්ලුම් නම්‍යතාවය ගනනය කරන්න. මිල ඉල්ලුම් නම්‍යාතවයට අනුව භාණ්ඩය කුමන භාණ්ඩයක් ද?

(ආ) ආදායම් ඉල්ලුම් නම්‍යතාවය ගනනය කරන්න. ආදායම් ඉල්ලුම් නම්‍යතාවයට අනුව මෙම භාණ්ඩය කුමන භාණ්ඩයක් ද? (ලකුණු 4)

v. ආදේශන හා ආදායම් ප්‍රතිවිපාක මත බාල භාණ්ඩයක් හඳුනාගත හැකි වන්නේ කෙසේ ද? (ලකුණු 5)

**(3).**

**i.** රජයක් මිල ඉල්ලුම් නම්‍යතාවය පූර්ණ අනම්‍යවන භාණ්ඩයක් සඳහා බදු අය කරන විට එය පාරිභෝගිකයාට අවාසි සහගත විය හැක්කේ කෙසේ ද? යන්න රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

**ii.** උපරිම මිල යන්නෙන් කුමක් අදහස් වේ ද? කිසියම් භාණ්ඩයකට සමතුලිත මිලට පහළ මිලක් ලෙස නියම කරනු ලබන උපරිම මිල නිසා භාණ්ඩ හිඟයක් ඇතිවන ආකාරය උචිත රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 4)

**iii.** ආර්ථිකයකට මිල ස්ථායිකරණය සඳහා යොදාගත හැකි ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 4)

**iv.** කිසියම් භාණ්ඩයක වෙළඳපොළ ඉල්ලුම් හා සැපයුම් ලේඛනයක් පහත දැක්වේ.

| මිල | ඉල්ලුම් ප්‍රමාණය | සැපයුම් ප්‍රමාණය |
|---|---|---|
| 100 | 200 | 0 |
| 400 | 200 | 600 |

(අ) සමතුලිතය ප්‍රස්තාරිකව නිරූපණය කර සමතුලිත මිල හා ප්‍රමාණය ගණනය කරන්න (ලකුණු 2)

(ආ) මෙම භාණ්ඩය මත රජය රුපියල් 50 ක නිෂ්පාදන සහනාධාරයක් ලබාදෙන විට නව සමතුලිත මිල හා ප්‍රමාණය කොපමණ වේ ද? එය ඉහත ප්‍රස්තාරයේ නිරූපණය කරන්න (ලකුණු 2)

(ඉ) රජය සහනාධාරය සඳහා දරණ මුළු වියදම කොපමණ ද? (ලකුණු 2)

(ඊ) සහනාධාරයේ වාසිය කුමන පාර්ශවයකට හිමි වේ ද? එය කොපමණ ද? (ලකුණු 2)

**(4).**

**i.** පහත දැක්වෙන ප්‍රකාශවල සත්‍ය අසත්‍ය බව පැහැදිලි කරන්න.

(අ) ප්‍රාමාණික ලාභය ආර්ථික ලාභයට සමාන වේ

(ආ) ලාභ උපරිම සමතුලිත කොන්දේසියේදී ආන්තික පිරිවැය ආන්තික ප්‍රතිලාභවලට සමාන වේ.

(ඉ) කෙටි කාලයේදී විචල්‍ය පිරිවැය ශුන්‍ය වුවද ස්ථාවර පිරිවැයක් පවතී

(ඊ) සංක්‍රාම ඉපයීම සාධකයක ආවශ්‍යක පිරිවැයයි (ලකුණු 8)

**ii.** ඉල්ලුම් සැපයුම් වක්‍රවල ස්වභාවය පැහැදිලි කරමින් පූර්ණ තරග ආයතනයක සමතුලිතය තීරණයවන ආකාරය රූපසටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

**iii.** (අ) පූර්ණ තරගය හා ඒකාධිකාරය අතර වෙනස්කම් තුනක් සඳහන් කරන්න.

(ආ) ඒකාධිකාරය හා කතිපයාධිකාරය අතර සමානකම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 6)

**(5).**

**i.** ජාතික ගිණුම්කරණයේ දී බැහැර කෙරෙන නමුත් ඵලදායි ආර්ථික ක්‍රියාකාරකම් මොනවාද? (ලකුණු 4)

**ii.** ජාතික ගිණුම්කරණය පිළිබඳ වූ කල්පිත ආර්ථිකයක දත්ත සමූහයක් පහතින් දැක්වේ. සංඛ්‍යා රුපියල් බිලියනවලින්.

| | |
|---|---|
| පෞද්ගලික හා රාජ්‍ය පාරිභෝජන වියදම | 40 00 |
| සේවක ගෙවීම් | 4 100 |
| නිෂ්පාදනය හා ආනයන මත ශුද්ධ බදු | 1 900 |
| දළ ආයෝජන | 2 900 |
| දළ මිශ්‍ර ආදායම | 1 500 |
| ශුද්ධ අපනයන | 2 100 |

පහත දැක්වෙන දෑ ගණනය කරන්න.

(අ) වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය

(ආ) දළ මෙහෙයුම් අතිරික්තය

(ඉ) දළ දේශීය ඉතුරුම් (ලකුණු 6)

**iii.** ආන්තික පරිභෝජන නැඹියාව 1 හෝ 1 ට වැඩි විය හැකිද? පැහැදිලි කරන්න. (ලකුණු 4)

**iv.** විවෘත ආර්ථිකයක කාන්දුවීම් හා විදීම් මොනවා ද? (ලකුණු 6)

"ආ" කොටස

(6).

i. සමපේක්ෂණ චේතනාව පොලී අනුපාතය මත රදාපවතින්නේ කෙසේ ද? යන්න පැහැදිලි කරන්න (ලකුණු 4)

ii. $M_4$ මුදල් සැපයුම තීරණය කරන සාධක මොනවා ද? (ලකුණු 4)

iii. ප්‍රමාණාත්මක ණය පාලන උපකරණ මහ බැංකුව විසින් මුදල් සැපයුම අඩු කිරීමට යොදාගනු ලබන්නේ කෙසේ ද? පැහැදිලි කරන්න (ලකුණු 4)

iv. උද්ධමන වියදම් පරතරය යන්නෙන් කුමක් අදහස් වේ ද? එයට පිළියමක් වශයෙන් මූල්‍ය ප්‍රතිපත්තිය යොදාගත හැක්කේ කෙසේ ද? (ලකුණු 4)

v. උද්ධමනය ආර්ථිකයක ආයෝජනයට හා මූර්ත අදායමට බලපාන්නේ කෙසේ ද? (ලකුණු 4)

(7).

i. බාහිරතා නිසා වෙළඳපොළ අසමත්වීම් හටගන්නේ ඇයි ? පැහැදිලි කරන්න. (ලකුණු 4)

ii. වර්තන හිගය හා අයවැය හිගය අතර ද අයවැය හිගය හා ප්‍රාථමික හිගය අතර ද වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 6)

iii. සෘජු බදු හා වක්‍ර බදු අතර වෙනස එම බදු සඳහා නිදර්ශන සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

iv. බදු අය කිරීමේදී සාධාරණත්ව මූලධර්මය යන්නෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 2)

v. ශ්‍රී ලංකා රජයේ ණය ධාරිතාවයේ හා ණය අනුපාතයේ මෙන්ම ණය ශ්‍රේණිගත කිරීම් වල මෑත කාලීන තත්ත්වය කෙබදු වේ ද ? (ලකුණු 4)

(8).

i. විදේශ වෙළඳාමේ තරගකාරිත්වයේ වාසිය ඇති කරනු ලබන මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 4)

ii. විදේශ වෙළඳ අනුපාතය යහපත් වන සෑම විටම රටක වෙළඳ ශේෂයේ අතිරික්තයක් ඇතිවේ. මෙම ප්‍රකාශයේ සත්‍ය අසත්‍ය බව පැහැදිලි කරන්න. (ලකුණු 6)

iii. කිසියම් රටකට නිපදවනු ලබන භාණ්ඩ වර්ග දෙකේම නිරපේක්ෂ වාසියක් හිමි නොවුනි. එම රටට සාපේක්ෂ වාසියක් හිමිකරගත නොහැකි වේ ද? උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

iv. පහත දැක්වෙන ගනුදෙනු ගෙවුම් ශේෂයේ කවර අනු ගිණුමට ඇතුළත් වේ ද?

(අ) ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා ආනයනය කරනු ලබන රන්

(ආ) විදේශ සංචාරක ඉපයීම්

(ඉ) විදේශ රටක් අධ්‍යාපනික උපකරණ මිලට ගැනීම සඳහා ලබාදෙන ඩොලර් මිලියන 5 ක් පරිත්‍යාගය

(ඊ) කොටස් වෙළඳපොළ තුළ විදේශ ආයතනයක් කර ලද ආයෝජනයක් සඳහා ලාභාංශ ගෙවීම්

(ලකුණු 4)

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

(9).

i. ජනතාවගේ ජීවන තත්ත්වය හා සුබසාධන මට්ටම තුළ තිරසාර සංවර්ධනය සාක්ෂාත් වේ ද? පැහැදිලි කරන්න (ලකුණු 3)

ii. දරිද්‍රතාවය මනිනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 4)

iii. (අ) මානව සංවර්ධන දර්ශකයේ ප්‍රධාන නිර්නායක මොනවාද? (ලකුණු 3)

(ආ) මානව සංවර්ධන දර්ශකයට අනුව මෑතකාලීනව පිළිවෙලින් ප්‍රථම ස්ථාන තුන අත්රගත් රටවල් හා ශ්‍රී ලංකාවේ ස්ථානය හා දර්ශක අගය කුමක් ද? (ලකුණු 5)

iv. ආදායම් විශමතාවය මැනීමේදී ජිනි සංගුණකය හා ලෝරන්ස් වක්‍රය යොදාගනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 4)

(10).

i. 2030 වර්ෂය වනවිට ශ්‍රී ලංකාව සපුරා ගැනීමට අපේක්ෂා කරන තිරසර සංවර්ධන ඉලක්ක මොනවා ද? (ලකුණු 5)

ii. වෘද්ධි ක්‍රියාවලිය ජයග්‍රහනය කළ රටවල සාර්ථකත්වයට බලපාන හේතු මොනවා ද? (ලකුණු 5)

iii. ශ්‍රී ලංකාව දරිද්‍රතාවය අවම කිරීම සඳහා ගත හැකි ක්‍රියා මාර්ග මොනවා ද යන්න පැහැදිලි කරන්න (ලකුණු 5)

iv. තාක්ෂණික භාවිතය හා පර්යේෂණ හා සංවර්ධන වියදම් ආර්ථිකයක වෘද්ධි ක්‍රියාවලියට දායක වන්නේ කෙසේ ද? (ලකුණු 5)

PAST PAPERS WIKI



Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## ආර්ථික විද්‍යාව පිළිතුරු- 1

අවසාන වාර පරීක්ෂණය - 2024

| | | | |
|---|---|---|---|
| **1. 5** | **14. 4** | **27. 4** | **40. 4** |
| **2. 4** | **15. 4** | **28. 5** | **41. 4** |
| **3. 4** | **16. 3** | **29. 4** | **42. 4** |
| **4. 1** | **17. 5** | **30. 2** | **43. 3** |
| **5. 3** | **18. 1** | **31. 2** | **44. 3** |
| **6. 4** | **19. 2** | **32. 5** | **45. 1** |
| **7. 4** | **20. 5** | **33. 2** | **46. 2** |
| **8. 1** | **21. 4** | **34. 2** | **47. 4** |
| **9. 5** | **22. 4** | **35. 3** | **48. 5** |
| **10. 5** | **23. 4** | **36. 1** | **49. 3** |
| **11. 4** | **24. 3** | **37. 4** | **50. 4** |
| **12. 2** | **25. 5** | **38. 3** | |
| **13. 4** | **26. 3** | **39. 1** | |

## ආර්ථික විද්‍යාව පිළිතුරු - 11 පත්‍රය

අවසාන වාර පරීක්ෂණය - 2024

**(1)**

(i) ස්වාභාවික සම්පත් භූමිය ලෙස හඳුනාගනු ලබන අතර මිනිසාගේ මැදිහත්වීමකින් තොරව එය නිරායාසයෙන් ආර්ථිකයක් සතුවන නිෂ්පාදන සම්පතකි. **(ලකුණු 1)**

කුඹුරක් ස්වභාවික සම්පතක් නොවේ. එය ප්‍රාග්ධනය ලෙස හඳුනාගනු ලබයි. **(ලකුණු 1)**


නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගනු ලබන මිනිසා විසින් නිෂ්පාදනය කරන ලද නිෂ්පාදන සාධක ප්‍රාග්ධනය ලෙස හඳුනාගනු ලබයි. **(ලකුණු 1)**

සිංහරාජ වනාන්තරය ස්වභාවික සාධකයක් වන අතර එය ප්‍රාග්ධනය නොව භූමිය වේ. **(ලකුණු 1)**

(ii) නිෂ්පාදන කාර්යක්ෂමතාවයක් පවතින විට, එක් භාණ්ඩයකින් ඒකකය බැගින් නිමැයුම වැඩි කරන විට අනෙක් භාණ්ඩයෙන් කැපකරන ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවීම,වැඩිවන ආවස්ථික පිරිවැය ලෙස හඳුනාගත හැකිය. **(ලකුණු 2)**

වැඩිවන ආවස්ථික පිරිවැය තුළ හැකියා මායිම් වක්‍රය බෑවුම වැඩිවේ. එවිට එය මූලයට අවතල හැඩයක් ගනු ලබයි. **(ලකුණු 1)**

එවැනි වක්‍රයක් පහත අයුරින් නිරූපණය කළ හැකිය.




**(ලකුණු 1)**

(iii) 1 සමාජ සාධාරණත්වය ඇති කිරීම


2 සමාජ ආරක්ෂණ ජාල, දුප්පත්කම අවම කිරීමේ රජයේ වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කරමින් සැම අයෙකුටම ගෞරවනීය ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාකර දීම.

3 පූර්ණ සේවා නියුක්තිය ඇති කිරීම

4 ආර්ථික ස්ථායිතාවය ඇති කිරීම

5 සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාවය ඇති කිරීම (ලකුණු **1x4 = 4**)


(iv) (අ)




(ලකුණු **1**)

ආර්ථිකයක ඌන සම්පත් උපයෝජනයක් හෝ නිෂ්පාදන අකාර්යක්ෂමතාවයක් පවතින විට නිමැවුම වැඩිවීම කෘෂි අංශයෙන් පමණක් සිදුවේ නම් එය ඉහත අයුරින් නිරූපනය කල හැකිවේ (ලකුණු **1**)


(ආ)




(ලකුණු **1**)


තාක්ෂණික පිරිහීම නිසා කෘෂි ඵලදායිතාවය අඩුවීම නිසා එම අංශයෙන් පමණක් වමට විතැන්වේ. (ලකුණු **1**)

(ඉ)




(ලකුණු **1**)

විදේශ ආයෝජනය වැඩිවීම රටක නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීමට ඉවහල්වන නිසා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන්වේ. (ලකුණු **1**)




(ලකුණු **1**)

ආර්ථිකයක නිමැවුම අඩුවීම තුළ තාවකාලික හෝ චක්‍රීය පසු බැසීමකට හේතු වේ. එවිට, නිමැයුම් පරතරයක් ඇති කරමින් වක්‍රය ඇතුළත ලක්ෂ්‍යයක් දක්වා ගමන් කරයි. (ලකුණු **1**)

**(2)**

(i) ආදේශක භාණ්ඩ මිල වැඩිවීම

අනුපූරක භාණ්ඩ මිල අඩුවීම

ආදායම වැඩිවීම

රුචිකත්වය වැඩිවීම

ගැනුම්කරුවන් සංඛ්‍යාව වැඩිවීම

අනාගත මිල වැඩි වේ යැයි අපේක්ෂා කිරීම

(ලකුණු **1x3 = 3**)

(ii)

| මිල ඉල්ලුම් නම්‍යතාවය | හරස් ඉල්ලුම් නම්‍යතාවය |
|---|---|
| ❖ සලකා බලන භාණ්ඩයේ මිල හැර අන්සාධක ස්ථාවරව පවතින විට මිලේ වෙනස සැලකිල්ලට ගනියි. | ❖ සම්බන්ධිත භාණ්ඩ මිල හැර අන්සාධක ස්ථාවරව පවතින විට සම්බන්ධිත භාණ්ඩ මිල සැලකිල්ලට ගනියි. |
| ❖ එකම භාණ්ඩයක නම්‍යතාවය ගණනය කරනු ලබයි. | ❖ භාණ්ඩ වර්ග දෙකක් අතර නම්‍යතාවය ගණනය කරනු ලබයි. |
| ❖ නම්‍යතාවය ධන වන භාණ්ඩ ගිෆන් භාණ්ඩ වේ. | ❖ නම්‍යතාවය ධනවන භාණ්ඩ ආදේශ භාණ්ඩ වේ. |
| ❖ නම්‍යතාවය ඍණවන භාණ්ඩ සාමාන්‍ය භාණ්ඩ වේ. | ❖ නම්‍යතාවය ඍණවන භාණ්ඩ අනුපූරක වේ. |

(ලකුණු **4**)

(iii) තැනින් තැනට වෙනස් වේ. නමුත් නම්‍ය වක්‍රයක නම්‍යතාවය එකට වැඩිවන අතර, අනම්‍ය වක්‍රයක නම්‍යතාවය නිතරම එකට අඩු වේ. (ලකුණු **2**)

අනම්‍ය වක්‍රයක් දිගේ ඉහළට ගමන් කරන විට නම්‍යතා සංගුණකය ක්‍රමයෙන් වැඩිවේ. (ලකුණු **1**)

නම්‍ය වක්‍රයක් දිගේ ඉහළට ගමන් කරන විට නම්‍යතා සංගුණකය ක්‍රමයෙන් අඩු වේ. (ලකුණු **1**)

(iv) (අ) $\mathbf{Edp} = \frac{\Delta Q\%}{\Delta P\%}$

$= \frac{-4\%}{2\%}$

$= -2$ (ලකුණු **1**)

සාමාන්‍ය භාණ්ඩයකි (ලකුණු **1**)

(ආ) $\mathbf{Edy} = \frac{\Delta Q\%}{\Delta Y\%}$

$= \frac{-4\%}{2\%}$

$= -2$ (ලකුණු **1**)

බාල භාණ්ඩයකි (ලකුණු **1**)

(v) බාල භාණ්ඩයක මිල වෙනස් වන විට ආදේශක ප්‍රතිවිපාකය ඍණ වේ. මිල වැඩි වන විට ආදේශක ප්‍රතිවිපාකයට අනුව ඉල්ලුම් ප්‍රමාණය අඩු කරනු ලබයි. (ලකුණු **1**)

එමෙන්ම බාල භාණ්ඩයක ආදායම් ප්‍රතිවිපාකය ද ඍණ වේ. මිල වැඩි වන විට මූර්ත ආදායමට බලපෑම් ඇති කරමින් මිල වැඩි වීමේදී ඉල්ලුම් ප්‍රමාණය වැඩි කරනු ලබයි. (ලකුණු **1**)


නමුත් බාල භාණ්ඩයක ස්වභාවය වන්නේ ඍණ ආදායම් ප්‍රතිවිපාකය නිශේධනය කරමින් ඍණ ආදේශක ප්‍රතිවිපාකය බලවත් වීමයි. (ලකුණු **2**)

එවිට, මිල ප්‍රතිවිපාකය ඍණ වීමෙන් බාල භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වේ. (ලකුණු **1**)

**(3)**

(i) පූර්ණ අනම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩ මත බදු අයකරන විට එහි සම්පූර්ණ බදු බර පාරිභෝගිකයාට දැරීමට සිදු වේ. බදු බර බෙදී නොයන නිසා එය පාරිභෝගිකයාට අවාසි වන්නේ, බද්දේ ප්‍රමාණයෙන්ම භාණ්ඩයේ මිල ඉහළ යාම ද නිසා ය. (ලකුණු 2)

එය පහත රූපසටහන ඇසුරින් පැහැදිලි කරගත හැකිවේ.





ඉහත ප්‍රස්තාරයට අනුව පැවති සමතුලිත මිල $P_2$ වන අතර බද්ද නිසා $P_3$ දක්වා මිල වැඩි වේ. **A+B** ප්‍රස්තාරයෙන් නිරූපණය වන්නේ පාරිභෝගිකයා දරන බදු බරයි. (ලකුණු 2)

(ii) කිසියම් භාණ්ඩයක් අලෙවි කළ යුතු උපරිම මිල රජය විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කිරීම උපරිම මිලක් ලෙස හඳුන්වයි.

උපරිම මිලක් නිමය කළ විට එම මිලට වඩා වැඩි මිලකට එම භාණ්ඩය හුවමාරුවීම නීතියට පටහැනි බව අඟවයි. (ලකුණු 2)

පාරිභෝගිකයාට වාසියක් සැලකීමේ අරමුණින් රජයක් සමතුලිත මිලට වඩා පහළ මිලක් ලෙස නියම කරන උපරිම මිලක් නිසා භාණ්ඩ හිඟයක් ඇති වේ.




ඉහත ප්‍රස්තාරයට අනුව උපරිම මිල $P_1$ වන අතර වෙළඳපොල භාණ්ඩ හිඟය $Q_3 - Q_1$ වේ. (ලකුණු 2)

(iii) 1 අවම මිල ප්‍රතිපත්තිය

2 ඌණ පූර්ණ ගෙවීම් ක්‍රම

3 සහතික මිල ප්‍රතිපත්තිය තුළ අතිරික්තය මිලදී ගැනීම


4 වෙළඳපොළ තොරතුරු සැපයීම

5 නිෂ්පාදන සලාක නියම කිරීම

6 ස්වාරක්ෂක තොග රැස්කිරීම හා මුදාහැරීම

7 නිෂ්පාදන සලාක නියම කිරීම (ලකුණු 1 x 4 = 4)

(iv)




(ලකුණු 2)

(අ) සමතුලිත මිල 200

සමතුලිත ප්‍රමාණය 200 (ලකුණු 01)

(ආ) සමතුලිත මිල 150

සමතුලිත ප්‍රමාණය 200 (ලකුණු 01)

(ඉ) රජයේ වියදම් = ඒකක සහනාධාරය x සමතුලිත ප්‍රමාණය

= **50** **200**

= රුː 10 000 (ලකුණු 02)

(ඊ) සහනාධාරයේ වාසිය රුː 10 000 කි. (ලකුණු 01)

එය පාරිභෝගිකයාට හිමි වේ. (ලකුණු 01)

**(4)**

(i) (අ) අසත්‍ය වේ

ප්‍රාමාණික ලාභය ආර්ථික ලාභයක් නොව පිරිවැයකි. එහිදී මුළු අයභාරය පිරිවැයට සමාන වෙන විට ආර්ථික ලාභ ඇති නොවේ. ආවස්ථික පිරිවැය ඉක්මවා අයභාරය පවතින වට ආර්ථික ලිභ ඇතිවේ.

(ආ) අසත්‍ය වේ

ලාභ උපරිම නිමැයුම් මට්ටමේදී ආන්තික අයභාරය ආන්තික පිරිවැයට සමානවේ

(ඉ) සත්‍ය වේ

කෙටි කාලයේදී විචල්‍ය පිරිවැය ශූන්‍ය වන්නේ නිමැවුම ශූන්‍ය වුවහොත් පමණි. නිමැවුම ශූන්‍ය වන විට පවතින නොවැළැක්විය හැකි පිරිවැය ස්ථාවර පිරිවැයයි.

(ඊ) සත්‍ය වේ


ඕනෑම සාධකයක් පවත්නා භාවිතයේ රඳවා තබා ගැනීමට අවශ්‍ය අවම ඉපයීම, එම සාධකයේ ආවස්ථික පිරිවැයයි. (ලකුණු 08)

(ii) ඉල්ලුම් වක්‍රවල ස්වභාවය වන්නේ පූර්ණ තරගකාරී ආයතන සෑම එකකම අපරිමිත නම්‍යතාවයකින් යුතු පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍ර වේ. ආයතන විශාල ප්‍රමාණයක් පවතින බැවින් ඒ සෑම ආයතනයකම ඉල්ලුම් වක්‍රය පූර්ණ නම්‍ය වේ. (ලකුණු 01)

එයට හේතුව සමජාතීය භාණ්ඩ නිපදවීමත්, එක් ආයතනයක සැපයුම මුළු වෙළඳපොළ සැපයුමෙන් සීමිත ප්‍රමාණයක් වීමත්, පූර්ණ තොරතුරු පැවතීමත් නිසා ආයතනයක් මිල ගනුවෙක් වීමයි (ලකුණු 01)

පූර්ණ තරගකාරී ආයතනයක සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයෙන් ඉහළට ගමන් කරනු ලබන ආන්තික පිරිවැය වක්‍රය එහි සැපයුම් වක්‍රය බවට පත්වේ (ලකුණු 01)

පූර්ණ තරගකාරී ආයතනයක සමතුලිත නිමැවුම් මට්ටම තීරණය වන්නේ ආන්තික අයභාරය හෝ මිල ආන්තික පිරිවැයට සමාන වීමෙනි. (ලකුණු 01)




ආන්තික අයභාර වක්‍රය ඉල්ලුම් වක්‍රය වන බැවින් පූර්ණ තරග ආයතනයක සමතුලිතය පැවරුණු මිල **P2** වන අතර ලාභ උපරිම නිමැවුම් මට්ටම **Q2** වේ. (ලකුණු 02)

(iii) (අ)

| පූර්ණ තරඟය | ඒකාධිකාරය |
|---|---|
| ❖ ආයතන විශාල ප්‍රමාණයකි | ❖ එක් ආයතනයකි |
| ❖ ප්‍රවේශයට බාධා නැත | ❖ ප්‍රවේශයට බාධා ඇත |
| ❖ සමජාතීය භාණ්ඩ නිපදවයි | ❖ සුවිශේෂී භාණ්ඩ නිපදවයි |
| ❖ තොරතුරු පූර්ණව පවතී | ❖ තොරතුරු පූර්ණව නොපවතියි |
| ❖ මිල ගනුවෙකි | ❖ මිල සකසන්නෙකි |

(ඕනෑම කරුණු 3කට ලකුණු 1 බැගින් ලකුණු 03)

(ආ) ප්‍රවේශයට බාධා පවතියි

තොරතුරු පූර්ණව හා පිරිවැයකින් තොරව ලබාගත නොහැකිය

වෙළෙඳපොළට බලපෑම් කළ හැකිය

මිල සකසන්නන් වේ

ඉල්ලුම් වක්‍රය පහළට බෑවුම් වේ (ඕනෑම කරුණකට 1 බැගින් ලකුණු 03)

**(5)**

(i) ගෙවීමකින් තොරව නිවස තුළ ඉටු කරනු ලබන ගෘහ සේවාවන්

නොමිලේ ලැබෙන ස්වාභාවික සම්පත්

ඉගෙනීම හා විවේකය

ස්වේච්ඡා සේවාවන්

මිල වෙනස්වීම හෝ ස්වාභාවික වර්ධනයක් හෝ මගින් සම්පත්වල සිදුවන වටිනාකමේ වෙනස (ලකුණු **4 x 1= 4**)

(ii) (අ)

| | |
|---|---|
| මුළු පරිභෝජන වියදම | = 4 000 |
| දළ ආයෝජනය | = 2 900 |
| ශුද්ධ අපනයන | = 2 100 |
| වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය රුෑ: | = 9 000 |

(ලකුණු 02)

(ආ)

| | |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | = 9 000 |
| සේවක ගෙවීම් | = - 4 100 |
| නිෂ්පාදනය හා ආනයන මත ශුද්ධ බදු | = - 1 900 |
| දළ මිශ්‍ර ආදායම | = - 1 500 |
| දළ මෙහෙයුම් අතිරික්තය | = 1 500 |

(ලකුණු 02)

(ඉ) දේශීය ඉතුරුම් = දළ දේශීය නිෂ්පාදිතය - පාරිභෝජනය

= 9 000 - 4 000

= රු: 5 000

(ලකුණු 02)

(iii) ආන්තික පරිභෝජන නැමියාව යනු වැය කළ හැකි ආදායම් වෙනසක් දැක්වෙන විට පරිභෝජනයේ ඇති වන වෙනස අනුපාතයක් ලෙස හෝ ප්‍රතිශතයක් ලෙස දැක්වීමයි.

වැය කළ හැකි ආදායම සමන්විත වන්නේ පරිභෝජනයෙන් සහ පෞද්ගලික ඉතුරුම්වලින් පමණි. **(Yd = c+s)** එනිසා වැය කළ හැකි ආදායම වෙනස් වන විට ඒ ඉන් කොටසක් පරිභෝජනය උදෙසා ද අනෙක් කොටස ඉතුරුම් සඳහා ද යොමු කරනු ලබයි.

වෙනස් වන වැය කළ හැකි ආදායම සම්පූර්ණයෙන්ම පරිභෝජනය සඳහා යොදවන විට ආන්තික පරිභෝජන නැමියාව උපරිම 1 ක් වේ. එය 1 ක් ඉක්මවා නොයයි.

එසේ නොවන සෑම විටම ආන්තික පරිභෝජන නැමියාව 1 ට අඩු වේ. ආන්තික ඉතුරුම් නැමියාවත් ආන්තික පරිභෝජන නැමියාවත් යන දෙකෙහි එකතුව 1 ට සමාන වේ.

**mpc + mps = 1** (ලකුණු 04)

(iv)

| කාන්දුවීම් | විදීම් |
|---|---|
| ඉතුරුම් | ආයෝජන |
| බදු | රාජ්‍ය වියදම |
| ආනයන | අපනයන |

(ලකුණු 06)

(ආ) කොටස

**(6)**

(i) වටිනාකමේ සංනිධියක කාර්ය ඉටු කරගැනීම උදෙසා ලාභ පරමාර්ථයෙන් මුදලට කරනු ලබන ඉල්ලුම සමපේක්ෂණ චේතනාවයි.

සමපේක්ෂණ චේතනාව සඳහා බලගත ප්‍රධාන නිර්ණායකය වන්නේ පොලී අනුපාතයයි. පොලී අනුපාතයත් සමපේක්ෂණ චේතනාවේත් මුදල් ඉල්ලුමත් අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් ඇති වේ. පොලී අනුපාතය වැඩි වනවිට සමපේක්ෂණ චේතනාවෙන් කරනු ලබන මුදල් ඉල්ලුම අඩුවේ.

පිළිනපත්වල මිල වෙනස්වීම පොලී අනුපාතය මත රදා පවතී, පොලී අනුපාතයට සංවේදී වීමෙන් පුද්ගලයන් පිළිනපත්වල ආයෝජනය කිරීමත්, මුදල් පිළිනපත්වලින් ඉවත් කර ගැනීමත් සිදුකරයි. පොලී අනුපාතය හා පිළිනපත් මිල අතර ප්‍රතිලෝම සම්බන්ධතාවයක් ඇති වේ. වර්තමාන පොලී අනුපාතය වැඩි වන විට අනාගත පොලී අනුපාතය අඩු වේ යැයි අපේක්ෂා කරන අතර අනාගතයේ පිළිනපත්වල ප්‍රාග්ධන ලාභයක් නිරූපණය කරන බැවින් වැඩියෙන් පිළිනපත්වල ආයෝජනය කරනු ලබයි. එවිට ළඟ තබාගන්නා මුදල් ප්‍රමාණය අඩු වේ.

අනෙක් අතට මුදල් ලගතබා ගැනීමේ අවස්ථික පිරිවැය පොලී අනුපතායන් නිරූපණය කරයි. පොලී අනුපාතය වැඩි වනවිට ළඟ තබා ගන්නා මුදල් ප්‍රමාණය අඩු කර ගනියි.

(ලකුණු 04)

(ii) <u>ශුද්ධ විදේශ වත්කම්</u>

- මහබැංකුව සතු ශුද්ධ විදේශ වත්කම්
- වාණිජ බැංකු සතු ශුද්ධ විදේශ වත්කම්
- බලපත්‍රලාභී විශේෂිත බැංකු සතු ශුද්ධ විදේශ වත්කම්

(ලකුණු 01)

ශුද්ධ දේශීය වත්කම්

- ➢ රජයට දුන් ණය
  - මහබැංකුව
  - වාණිජ බැංකු
  - බලපත්‍රලාභී විශේෂිත බැංකු
  - බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (ලකුණු 01)
- ➢ පෞද්ගලික අංශයට ලබාදුන් ණය
  - වාණිජ බැංකු
  - බලපත්‍රලාභී විශේෂිත බැංකු
  - බලපත්‍රලාභී මූල්‍ය සමාගම් (ලකුණු 01)

ඒකාබද්ධ බැංකු ක්‍රමයේ අනෙකුත් ශුද්ධ වත්කම (ලකුණු 01)

(iii) මහ බැංකුවේ විවෘත වෙළඳපොළ කටයුතුවල මහබැංකුව සුරකුම් පත් අලෙවිකරණ විට වාණිජ බැංකු ඒවා මිලට ගැනීමට යාමේදී වානිජ බැංකු සංචිත අඩුවී ණය සැපයුම අඩු වේ. එවිට මුදල් සැපයුම අඩුවේ. (ලකුණු 02)

- ප්‍රතිපත්ති පොලී අනුපාතය වැඩි කරන විට මුදල් සැපයුම අඩුවේ.
- ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය වැඩි කරන විට මුදල් සැපයුම අඩුවේ. (ලකුණු 02)

(iv) ආර්ථිකයක පූර්ණ සේවා නියුක්ති මට්ටම් පවත්වාගෙන යාමට අවශ්‍ය සමහර වියදමට වඩා වැඩියෙන් පවතින සමහර වියදම ආර්ථිකයක පවතින විට එය උද්ධමන වියදම් පරතරය ලෙස හඳුන්වයි.

උද්ධමන පරතරයක් පාලනය සඳහා ශ්‍රී ලංකාවේ මහබැංකුව තම මූල්‍ය ප්‍රතිපත්තිය හසුරුවනු ලබයි. එහිදී මුදල් සැපයුම අඩු කිරීම මගින් ද පොලී අනුපාතය වැඩි කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුව සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරන අතර ඒ සඳහා මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ තුළ ක්‍රියාත්මක කරනු ලබයි. (ලකුණු 04)

(v) උද්ධමනයක් පවතින කාලයක නිෂ්පාදන ක්ෂේත්‍රවල කරනු ලබන ආයෝජනය අඩු වේ. එයට හේතුව වර්තමානයේ කරනු ලබන ආයෝජනයේ අනාගත මූර්ත අගය පිරිහීමයි. එනම්, උද්ධමනය නිසා අනාගත අවිනිශ්චිතතා ඇති කරන අතර ආයෝජනයක් මූර්ත වත්කම්වල ආයෝජනයෙන් ඉවත් වීමෙන් ඉඩම් වල රන් වැනි සමපේක්ෂණ වත්කම්වල ආයොජනයට පෙළඹී මෙන් ආයෝජනයේ විකෘතිතා හටගන්නා නිසාය.

ආර්ථිකයක උද්ධමනයක් පවතින කාලයක නාමික ආදායමේ ක්‍රය ශක්තිය හෙවත් මූර්ත ආදායම පිරිහෙනු ඇත. එයට හේතුව උද්ධමනය නිසා භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යන බැවින් මුදල් ආදායමෙන් පෙරට වඩා ලබාගැනීමට හැකිවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය අඩුවන බැවිනි. නාමික ආදායමට කොපමණ ප්‍රතිශතයකින් වැඩි වුව ද උද්ධමන අනුපාතය එම නාමික ආදායමේ වැඩිවීමේ ප්‍රතිශතය ඉක්මවා යන විට මූර්ත ආදායමේ ඇතිවන වෙනස ඍණ අගයක් ලෙස ද වාර්තා විය හැකිය.

උදාහරණ :-

මූර්ත ආදායමේ වෙනස = නාමික ආදායමේ වැඩිවීම - මිල මට්ටමේ වැඩිවීම

= 20% - 25%

= - 5% (ලකුණු 04)

**(7)**

(i) පහත දැක්වෙන හේතු නිසා බාහිතා වෙළඳපොළ අසමත්වීම් ඇති කරනු ලබයි.

1 බාහිරතා නිසා බාහිර පිරිවැයක් හෝ බාහිර ප්‍රතිලාභ ඇති වීම

2 සමාජ පිරිවැයටත් පෞද්ගලික පිරිවැයත් අතර වෙනසක් ඇති වීම හෝ සමාජ ප්‍රතිලාභ හා පෞද්ගලික ප්‍රතිලාභ අතර වෙනසක් ඇති වීම

3 පරිභෝජනයේ හෝ නිෂ්පාදනයේ ඍණ බාහිරතාවයකදී අධි පරිභෝජනයක් හෝ අධි නිෂ්පාදනයක් ඇති වේ. අහිමිවන සුබසාධනයක් ඇති වේ.

4 පරිභෝජනයේ හෝ නිෂ්පාදනයේ ධන බාහිරතා ඇති කරන විට ඌණ පරිභෝජනයක් හෝ ඌණ නිෂ්පාදනයක් ඇති වේ. අහිමිවන සුබසාධනයක් ඇතිවීම (ලකුණු 04)

(ii) රාජ්‍ය අයභාරයෙන් වර්තන වියදම අඩු කළ විට රාජ්‍ය ආදායමට වඩා වර්තන වියදම වැඩි වනවිට එය වර්තන ගිණුමේ හිගයක් ලෙස හඳුන්වයි.

නමුත් දීමනා තුළ රාජ්‍ය අයභාරයෙන් වර්තන හා ප්‍රාග්ධන වියදම අඩු කළ විට රාජ්‍ය වියදමට වඩා රාජ්‍ය අයභාරය අඩුවන විට අයවැය හිගයක් ඇති වේ. (ලකුණු 03)

අයවැය හිගය හා ප්‍රාථමික හිගය අතර ද වෙනසක් ඇති වේ. ණය පොලිය හැර අයවැය හිගය ප්‍රාථමික ගිණුමේ හිගයයි. දීමනා ඇතුළත් මුළු අයභාරයෙන් පොලී හැර වර්තන වියදම හා ප්‍රාග්ධන වියදම අඩු කිරීමෙන් ලැබෙන හිග ශේෂය ප්‍රාථමික ගිණුමේ ශේෂය වේ. (ලකුණු 03)

(iii) බද්දක් අය කළ අදාළ පාර්ශවය විසින් සෘජුවම ගෙවිය යුතු තවත් අයෙකුට විතැන් කළ නොහැකි ආකාරයේ බදු සෘජු බදු ලෙස හඳුන්වයි.

උදාහරණ :-

පුද්ගල ආදායම් බදු

සමාගම් බදු

උපයනවිට ගෙවීම් බදු

නමුත් රජයක් බද්දක් අය කළ විට අදාළ පාර්ශවය එය සම්පූර්ණයෙන් හෝ කොටසක් තවත් පාර්ශවයකට විතැන් කළ හැකි ආකාරයේ බදු වක්‍ර බදු වේ. විතැන් කිරීමේ හැකියාවක් ඇති බදු වක්‍ර බදු වේ.

උදාහරණ :- එකතු කළ අගය මත බදු

නිෂ්පාදන බදු

ආනයන බදු (ලකුණු 04)

(iv) බදු ක්‍රමය බදු සියළු බදු ගෙවන්නන්ට සාධාරණ විය යුතුය. සමාන ආදායම් ලාභීන්ගෙන් එක හා සමාන බදු අය කරමින් ද, අසමාන ආදායම්ලාභීන්ගෙන් අසමාන ලෙස බදු අයකරමින් ද සාධාරණත්වය බදු මූලධර්මයක් ලෙස ක්‍රියාත්මක කළ හැකිය.

ඉහළ ආදායම්ලාභීන්ට වැඩි බදු ප්‍රමාණයක් පහළ ආදායම්ලාභීන්ට අඩු බදු ප්‍රමාණයක් හා ආදායම් නොමැති දරිද්‍රතාවයෙන් පෙළෙන්නන්ට බදු ශූන්‍යතාවයක් තුළ සිරස් සාධාරණත්වය ඉටු කළ හැකිය. සමාන ආදායම්ලාභීන්ට සමාන බදු ප්‍රතිශතයක් අයකරමින් තිරස් සාධාරණත්වය ඉටු කළ හැකිය. (ලකුණු 02)

(v) ශ්‍රී ලංකාවේ ණය ධාරිතාවය ක්‍රමයෙන් වැඩිවෙමින් පවතියි.

| වර්ෂය | ආසන්න රු: ට්‍රිලියනට |
|---|---|
| 2020 | 13 |
| 2022 | 28 |
| 2023 | 30 |

රාජ්‍ය ණය සේවා අනුපාතය ඉහළ යාම

| | |
|---|---|
| 2020 | 96.6% |
| 2021 | 100% |
| 2022 | 114.2% |

මුළු විදේශ ණය අනුපාතය ඉහළ යාම

| | |
|---|---|
| 2020 | 58.4% |
| 2021 | 64.6% |
| 2022 | 65% |

ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කරන ආයතන දිගුකාලීන ණය පැහැර හරින රටක් ලෙස නම් කිරීම

| ආයතනය | ලබාදුන් ශ්‍රේණිය |
|---|---|
| පිච් රේටින් ආයතනය | **RD** |
| එස් ඇන්ඩ් පී | **SD** |
| මූඩීස් | **Ca** |

(ලකුණු 04)

**(8)**

(i) <u>පිරිවැය වාසි මූලාශ්‍ර</u>

- එලදායිතාවය ඉහළ මට්ටමක පැවතීම
- ධාරිතා උපයෝජනය ඉහළ මට්ටමක පැවතීම
- තාක්ෂණය සඵල අයුරින් යොදාගැනීම
- වඩා කාර්යක්ෂම බෙදා හැරීමේ ජාලය

(ලකුණු 02)

<u>ප්‍රභේදනය සඳහා මූලාශ්‍ර</u>

- ගුණාත්මක වශයෙන් ඉතා ඉහළ මට්ටමේ නිෂ්පාදන බිහිකිරීම
- සන්නම් සඳහා යොමුවීම
- නවෝත්පාදන බිහි කිරීම
- බුද්ධිමය දේපළ හිමි කර ගැනීම
- ප්‍රචාරණය

(ලකුණු 02)

(ii) අසත්‍ය ප්‍රකාශයකි. භාණ්ඩ වෙළඳ අනුපාතය යහපත් වන සෑම විටම එරටේ වෙළඳ ශේෂය අතිරික්තයක් ඇති නොවේ.

භාණ්ඩ වෙළඳ අනුපාතයෙන් මනිනු ලබන්නේ අපනයන ඒකකයක ආනයන ක්‍රය ශක්තිය පමණි.

වෙළඳ ශේෂයෙන් නිරූපණය වන්නේ සමස්ත අපනයන ආදායම හා සමස්ත ආනයන වියදම අතර වෙනසයි. (ලකුණු 03)


රටක භාණ්ඩ වෙළඳ අනුපාතය යහපත් වනවිට වෙළඳ ශේෂය යහපත් වේ නම්, වෙළඳ අනුපාතය අයහපත් විට වෙළඳ ශේෂය අයහපත් විය යුතුය. එය එසේ සෑමවිටම සිදු නොවේ. 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ භාණ්ඩ වෙළඳ අනුපාතය අයහපත් වුවද වෙළඳ ඍණ ශේෂය පෙරට වඩා අඩු වී යහපත් වීමක් නිරූපණය වේ.විදේශ වෙළෙද අනුපාතය යහපත් උවද සමහර වර්ෂවල වෙළෙද ශේෂය අතිරික්තයක් වාර්තාවී නොමැත. (ලකුණු 01)

(iii) නිරපේක්ෂ වාසිය යන්නෙන් අදහස් වන්නේ කිසියම් රටක් වැඩි ඵලදායිතාවයකින් හෝ අඩු සම්පත් පිරිවැයක් යටතේ භාණ්ඩ හා සේවා නිපදවීමයි.

සාපේක්ෂ වාසිය යන්නෙන් අදහස් වන්නේ කිසියම් රටකට සාපේක්ෂව තවත් රටක් අඩුම ආවස්ථික පිරිවැයක් යටතේ භාණ්ඩ හා සේවා නිපදවීමයි. (ලකුණු 02)

නිපදවනු ලබන භාණ්ඩ වර්ග දෙකේ වාසිය එකම රටකට හිමිවන විට අනෙක් රටට නිරපේක්ෂ වාසියක් හිමි නොවේ. නමුත් සාපේක්ෂ වාසියක් හිමි කරගත හැකිවේ.

පහතින් නිරූපණය වන්නේ භාණ්ඩ වර්ග දෙකක් නිපදවා ආර්ථිකයන් දෙකක නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර දෙකයි.




ඉහත රූපසටහනට අනුව භාණ්ඩ වර්ග දෙකේම නිරපේක්ෂව වාසිය හිමිවන්නේ **A** රටටය. නමුත් **B** රටට නිරපේක්ෂ වාසියක් හිමි නොවේ.

නමුත් සාපේක්ෂ වාසියට අනුව අඩුම ආවස්ථික පිරිවැයක් හිමිකර ගැනීම නිසා **B** රටට **X** භාණ්ඩ නිපදවීමේ සාපේක්ෂ වාසිය හිමිවේ. (ලකුණු 04)

(iv) (අ) භාණ්ඩ ගිණුම (වෙළඳ ගිණුම)
(ආ) සේවා ගිණුම
(ඉ) ද්විතීක ආදායම් ගිණුම
(ඊ) ප්‍රාථමික ආදායම් ගිණුම (ලකුණු 04)

**(9)**

(i) ජනතාවගේ ජීවන තත්ත්වය සුබසාධන මට්ටම තුළ තිරසර සංවර්ධනය සාක්ෂාත් නොවේ. සංවර්ධනය හා තිරසර සංවර්ධනය අතර වෙනසක් ඇති වේ.

ආර්ථික වෘද්ධියක් සමග මිනිසුන්ගේ භෞතික ජීවන තත්ත්වයේ සුබසාධන මට්ටමේ සිදුවන අඛණ්ඩ ඉහළයාමක් තුළින් සිදුවන සංවර්ධනය බහුමාන ක්‍රියාවලියයි.

සංවර්ධනය උදෙසා කටයුතු කරන ආර්ථිකයක් පරිසර පැතිකඩ පිළිබඳව සැලකිල්ලට ගනිමින් එය සුරක්ෂිත කරමින් කරනු ලබන සංවර්ධනයක් තිරසර සංවර්ධනයක් ලෙස හැඳින්විය හැකිය. වරතමානයේදී සම්පත් භාවිත කළ යුත්තේ ඒවා අනාගත පරම්පරාවට අහිමි නොවන ආකාරයට බව තිරසර සංවර්ධනයෙන් ප්‍රකාශ වේ. (ලකුණු 03)

(ii) දරිද්‍රතාවය කිහිපාකාරයකින් මනිනු ලබයි.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මනිනු ලබන්නේ දරිද්‍රතා රේඛා ඇසුරින්, මාසික ප්‍රතිශීර්ෂ ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය සඳහා වැයවන මූර්ත වියදම සැලකිල්ලට ගෙන එය මනිනු ලබයි. දරිද්‍රතා ඉමට පහළ ජනගහනය දුප්පත් ලෙස නම් කරයි.එය පදනම් කරගෙන ජාතික දරිඳතා ආපාතයෙන්ද,අන්තර් දරිඳතා දර්ශකයෙන්ද දරිඳතාවය ප්‍රකාශ කරනු ලබයි, බහුමාන දරිඳතා දර්ශකයෙන් ද දරිඳතාවය මිණුම් කරනු ලබයි

ලෝක දරිද්‍රතාවය මනිනු ලබන්නේ ජාත්‍යන්තර දරිද්‍රතා ඉම යොදා ගනී. ඒ සඳහා දිනකට මිනිසෙකුට ජීවත් වීමට අවශ්‍ය ආහාර හා ආහාර නොවන ද්‍රව්‍ය මිලදීගැනීමට අවශ්‍ය වියදම ප්‍රකාශ කරනු ලබයි. උදාහරණයක් වශයෙන් දිනකට ඩොලර් 2.15 ආදි ලෙස එය නියම කරනු ලබයි. එම ප්‍රමාණයට පහළ ජනගහනය ලෝක දරිද්‍රතාවෙන් පෙළෙන ජනගහනය වේ. (ලකුණු 04)

(iii) (අ) අධ්‍යාපනය (ආ) ස්විස්ටර්ලන්තය
සෞඛ්‍ය නෝර්වේ
ජීවන තත්ත්වය (ලකුණු 03) ඩෙන්මාර්කය (ලකුණු 03)

ශ්‍රී ලංකාව - 78
දර්ශකය - 0.780 (ලකුණු 02)

(iv) $45^0$ සම ආදායම ව්‍යාප්ති රේඛාව හා ලෝරන්ස් වක්‍රය අතරමැදි ප්‍රදේශය අතර පරාසයෙන් රටක ආදායම් විෂමතාවය නිරූපණය කරනු ලබයි. සම ආදායම් ව්‍යාප්ති රේඛාවෙන් ලෝරන්ස් වක්‍රය දුරස්වන විට ආදායම් විෂමතාවය වැඩිවන අතර එය සමීපවනවිට ආදායම් විෂමතාවය අඩුවන බව ගම්‍ය වේ.

ලෝරන්ස් වක්‍රය පදනම් කරගෙන ජිනි සංගුණකය ගණනය කරනු ලබයි. සම ආදායම් ව්‍යාප්ති රේඛාවක් ලෝරන්ස් වක්‍රයක් අතර ප්‍රදේශයේ වර්ගඵලය, සම ආදායම් ව්‍යාප්ති රේඛාවේ. පහළ ප්‍රදේශයේ වර්ගඵලය අතර අනුපාතයන් ජිනි සංගුණකය ගණනය කරනු ලබයි.

ජිනි සංගුණකය ඉහළ යනවිට ආදායම් විෂමතාවය වැඩි බවක් ජිනී සංගුණකය පහළ යන විට ආදායම් විෂමතාවය අඩු බවක් ගම්‍ය වේ.

(ලකුණු 04)

**(10)**

(i) දරිද්‍රතාවය තුරන් කිරීම
ගුණාත්මක අධ්‍යාපනය
පුනර්ජනනීය බලශක්තිය
අසමානතාවයන් අඩු කිරීම
තිරසර පුරවර හා ප්‍රජාව (ලකුණු 05)

(ii)
- ගෝලීය ආර්ථිකයක් පූර්ණ ලෙස වාසි ලබාගැනීම
- සාර්ව ආර්ථික ස්ථායිතාවය පවත්වා ගැනීම
- ඉහළ ඉතුරුම් මට්ටම් පවත්වාගෙන යාම
- සම්පත් බෙදීයාම වෙළඳපොළ මගින් සිදුවීම
- ඉහළ ආයෝජන මට්ටමක් පවත්වාගෙන යාම (ලකුණු 05)

(iii) - සාර්ව සහභාගිත්ව ආර්ථික වෘද්ධියක් ඇති කර ගැනීමට කටයුතු කිරීම එමගින් දරිද්‍රතාවයෙන් පෙළෙන ජන සමාජයද දළ දේශීය නිෂ්පාදිතයට දායක කරගනිමි ඔවුන්ට ප්‍රතිලාභ හිමිකර දියහැකි වීම.

- සමාජ ආරක්ෂණ රැහැන් ක්‍රියාත්මක කිරීම. ආධාර ලබාදීම වෙනුවට කළ යුත්තේ දිළිඳුකමින් මුදවාගැනීමට කටයුතු කිරීමයි. සමෘද්ධි වැනි ක්‍රමවේද දුප්පත්කම පවත්වාගෙන යාමට හේතු වේ. එමගින් යම් පිලියමක් ලැබුණද වෘත්තීය පුහුණු වැඩසටහන් සමග කුඩා සහන ණය සැපයීම ස්වයන් රැකියා ජනනය කිරීම මගින් හා රැකියා ලබාදීම මගින් සේවා නියුක්තිය ඉහළ නැංවීම තුළින් ඔවුන් දුප්පත්කමින් මුදවා ගත හැකිවේ.

- විදේශ සේවා නියුක්ති අවස්ථා සුලභ කිරීම

- යහපාලනික ආණ්ඩවක් තුළින් අනවශ්‍ය වියදම් කපාහැර එමගින් රැකියා සුළඹ කිරීම සඳහා අරමුදල් වෙන් කිරීම.
- අපනයන අභිමුඛ කර්මාන්තකරණය තුළ කුඩා ව්‍යවසායකයන් බිහිකිරීම සඳහා අඩු පොලී සහිත ණය පහසුකම් ලබාදීම හා ණය ගෙවීමේ කාලසීමාව දීර්ස කිරීම තුළින් සේවා නියුක්තිය ඉහළ නැංවීම එම ශ්‍රම අවස්ථා සඳහා දරිද්‍රතාවයෙන් පෙළෙන පවුලකින් එක් අයෙකුවත් අවම වශයෙන් සේවයට බඳවා ගැනීම

-යටිතල පහසුකම් දියුණු කිරීම හා වෘද්ධි ක්‍රියාවලිය දීප ව්‍යාප්තව ඇති කරමින් ජනතාවට වැඩි ආදායම් ලැබෙන මූලාශ්‍ර බිහි කිරීම.

-කෘෂි අංශයේ ඵලදායිතාවය ඉහළ නැන්වීමට කටයුතු කිරීම, ඒ සඳහා නව බීජ වර්ග හඳුන්වාදීම, සහනාධාර සැපයීම, තාක්ෂණික උපදෙස් ලබාදීම තුළින් කෘෂි කර්මාන්තයේ නිරතවන දරිද්‍රතාවයෙන් පෙළෙන ජනගහනයට පිළිසරණක් වීම.

-අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම රැකියා වෙළඳපොළට උචිත උසස් අධ්‍යාපන ක්‍රමයක් ඇතිකිරීම

-කිසිදු රැකියාවක් කිරීමට අපහසු පූර්ණ බෙලහීන ජන පිරිස සඳහා සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාත්මක කරවීම (ලකුණු 05)

(iv) වෘද්ධි ක්‍රියාවලිය ජයගත් රටවල තාක්ෂණික භාවිතය හා පර්යේෂණ හා සංවර්ධන වියදම් ඉහළ මට්ටමක පවතී.

- නවතාක්ෂණික භාවිතය රටක ඵලදායිතාවය වැඩි කිරීමටත් නිෂ්පාදන පිරිවැය අඩු කිරීමටත් හේතු වේ. ඵලදායිතාවය වැඩිවීම තුළින් රටක නිෂ්පාදන ධාරිතාවය පෙරට වඩා ඉහළ වනු ඇත.
- කෘෂි, කාර්මික, සේවා අංශවලට ව්‍යුහාත්මක වෙනස්කම් ඇති කරමින් දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නංවා ගත හැකිවීම
- ශ්‍රම බලකායේ නිපුණතාවයන් ඉහළ යාම තුළින් ඉහළ කාර්යක්ෂමතාවයක් ළඟා කර ගත හැකි වන අතර එමගින් ආර්ථික වෘද්ධිය ඉහළ නංවා ගැනීමටත් එහි ප්‍රතිලාභ තුළින් දිගින් දිගටම වෘද්ධි ක්‍රියාවලියකට යොමුවිය හැකිය. (ලකුණු 02)

- පර්යේෂණ හා සංවර්ධන වියදම් සඳහා කරනු ලබන ආයෝජන ද වෘද්ධි ක්‍රියාවලියට ප්‍රධාන දායකත්වයක් ලබාදේ.

වෘද්ධි ක්‍රියාවලිය ජයගත් රටවල පර්යේෂණ හා සංවර්ධන වියදම් ඉතා ඉහළ මට්ටමක පැවතීම.

උදාහරණයක් ලෙස ඇමරිකා එක්සත් ජනපදයේ **Amazon** සමාගම පමණක් 2022 වර්ෂයේ කරන ලද පර්යේෂණ හා සංවර්ධන වියදම ඩොලර් බිලියන 73.2 කි. එය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට මදක් අඩුවෙන් පවතී.චීනය විසින් කරන ලද වියදම ඩොලර් බිලියන 620ක් පමණ වේ එය ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය මෙන් 6 ගුණයකට වඩා වැඩි වේ

එමගින් ඔවුන්ට තරගකාරීත්වය ජයගැනීමට හා නව්‍යතා බිහිකිරීමට, ඵලදායිතාවය වැඩි කරගැනීමට, හා ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම තුළින් නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට හැකිවේ, එවිට එය සෘජුවම අපේක්ෂිත වෘද්ධියට දායක වේ.

තාක්ෂණය දියුණුව උදෙසා ද පර්යේෂණ හා සංවර්ධන දායක වේ.

(ලකුණු 03)